සිලවිකර, vt. to balance an account, to liquidate

සිලවි-ව, n. substitute, transaction

සිලමටු-වා, n. a bird, sandpiper (*totarns glareola*)

සිලි, n. fruit

සිලිම(ම්), n. shilling (*Pg.*)

සිලිමුවා(ම), n. bee

සිලිසෙය, vt. to flow out, to shed

සලිල්(b.), n. water, a plant (පුෂ්පවිශේෂය)

සලිල්දන්, n. lotus

සලිල්ද, n. cloud, rainy cloud

සලිල්නා(b.), n. epithet of Varuna

සලිල්ඛෙමු-ම, n. eddy, whirlpool

සලිල(ල්), n. water

සලිලාර, *n.* sea, ocean

සිලුටු, *a.* smooth, polished

සිලුපාන්(*b.*), *n.* cold water

සිංලව(වි), සිංලා-ව, } *n.*=ශ්‍රීලංකාව

සිව්, *a.* four. *n.* -ඉස්(*b.*), epithet of Vishnu

සිව්ගහන්(*b.*), *n.* epithet of Brahma

සිව්කුල-ය, *n.* the four castes (Brahmin, Kshatriya, Vaisya, and *Sudra*)

සිව්දාගඳ, *n.* four perfumes (*viz.* saffron, frankincence, gum benjamin or olibanum, and incence *Yavana*: කොකුම්, ශෝතිපුප්, තුව රලා, තුරුක්කතෙල්)

සිව්දිග(ක්), *n.*=චතුර්දිශා

සිව්දිවරජ, *n.* universal monarch

සිව්පද-ය, *n.* stanza of four lines

සිව්පස-ය, *n.*=සතරපසය

සිව්පාය, *n.*=චතුෂ්පාය

සිව්පා-වා, *n.* quadruped (*pl.* සිව්පාවෝ)

සිව්පිළිසිඹියා-ව, *n.* four divisions of knowledge which lead to Rahatship

සිව්බලකෙළි-ය, *n.* game of chess

සිව්බා(*b.*), *n.* epithet of Vishnu

සිව්මාදුරුකවුළු-ව, *n.* window with four apertures

සිවුමැලි, *a.* soft, delicate

සිව්මියුරා, *n.* the four sweets (*viz.* bee-honey, ghee, butter, and jaggery)

සුව්රඝසෙන් *b.*), } *n.*=චතුරඞ්ගිනීසේනාව
සවරඝසෙනාග, }

සිව්රද, *n.*=සතරවරම්දෙවියෝ

සිවරැස්, *a.* square. *n.*=ශීර්ෂපලු

සුව්වණ්ණ, *n.* four sorts or classes

සිව්ෑත්(*b.*), *n.* epithet of Brahma

සුව්වරම්දෙවි-ඹෝ, *n.*=සතරවරම්දෙවියෝ

සුව්වස්(*b.*), *n.* epithet of Vishnu

සිව්වෙ-ත, *n.*=චතුර්වේදය

සිව්සතරු තැ(ක්), *n.*=චතුස්සඞ්ග්‍රහවස්තුව

සිව්සැට, *n.* sixty-four

සිව්ගිස් *b.*), *n.* epithet of Brahma

සිවලා (ල), *n.* jackal (*pl.* සිවල්ලු)

සුවිංගුරු, *n.* red chalk

සිවිකා-, *n.* *P.* } palanquin, litter, howdah
සිවිගෙ-ය, *n.* }

සිවිය, *n.* a plant (*piper charya*)

සිවි-ය, *n.* lamina, coat, skin, colour, sun-beam

සිවුරු, *n.*=චීවර & සිවුරු

සිස්, *a.* empty, vain. *n.* -කම(ව), emptiness

සිස්ල(or බ)ල, *n.* bird

සිස(ස්), *n.* head, top

සිහල, *ppa.*=සිහැලු

සිසාර, *vt.* to move round (සිසාරා, සිසාල)

සිසාලු, *ppa.* (from සිසාර, moved round

සිසි(*b*), *n.* moon

සිසිකත, *n.* moon-beam, crystal

සිසිසු(or පු)ත්(b.), *n.* planet Mercury

සිසුපුල්, *n.* blue lotus

සිසිර, *n.*=ශිශිර. *n.* -කර(b.), moon

සිසිල්, *a.* cold. *vt.* -කර, to cool

සිසිර(ල), *n.* cold, cold season, sandal-wood

සිප්පරා-මා, *n.* clever or skilful man

සිප්පු-වා, *n.*=සිප්පා

සිහ, *n.* lion

සිහිකාසුත්(b.), *n.* epithet of Rahu (the ascending node)

සිහසුන(ය), *n.* throne

සිහිල්, *a* & *n.*=සිසිල

සිහින-ය, *n.* sleep, dream, fineness

සිහින්, *a.* small, fine. *vt.* -කර, to make small

සීතල, *a.* cold

සිංගාරම(ය), *n.* drum, tabour, any musical instrument (*T.*)

සිංඛි, *n.* ako. poison

සිංකිත්ත(කිති), *n.* little, bit

සිංත, *n.*=කලාදුරු (bo. සිංනාස)

සිංහලුය, *n.*=ගොඩාමතාබා

සිංහ-යා, n. lion. vt. -නාදකර, to roar (as a lion), to speak fearlessly

සිංහල(or ළ)(b.), n. Ceylon, Sinhalese language

සිංහල(or ළ), a. Sinhalese. n. -යා, Sinhalese man

සිංහලේ (or ලේ), *n.* Ceylon, generally applied to the inland part ruled by native kings as distinguished from the maritime parts ruled by the Europeans

සිංහශය්‍යා-ව, n. } sleeping attitude of a lion
සිංහසෙය්‍යා-ව, *n.* } [lions

සිංහාසන-ය, n. throne (being supported by

සිංහාසනාරූඪ, a. ascended the throne

සි(*b.*), *n.* top of a tree, lion, cold, dew, ploughing, laughter (*v.* සී)

සිකම(මි), *n.* ploughing, agriculture

සිකර(*b.*), *n.* drizzle, mist, spray

සිට්ටු-ව, *n.* memorandum, receipt, ticket, decree or order of court written on a palmyra or a talipot leaf and signed by Adigar

සීතා, n. name of the wife of Rama

සීදත්, *n.* flux tinged with blood [Mahameru

සීදන්ත, *n.* name of a sea surrounding the

සිත්, *a.*=සිසිත්

සින(*b.*), *n.* dream, fineness, delicateness

සිනක්කාරම්, *n.* alum (*T.*)

සිනච්චට්ටි, *n.* cast iron (*T.*)

සිනමුල්, *n.* China root (a medicinal root)

සිහි-ය, *n.* dream

සීනි, *n.* sugar (*T.*) [ලුව

සිකිය, *n.* a shrub (*acacia farnisiana*) (*v.* සී

සිනුක්, *n.* milk hedge plant (*euphorbia tortilis*)

සිනු-ව, *n.* bell (*Pg.*)

සිපද-ය, *n.* (*i/o.* ශ්ලීපදය); elephantiasis

සිමයාන-ය, n. boundary-line

සිමා-ව, n. boundary, limit

සිමාගුර(රා), *n.* window

සිය, *n.* hundred, ploughing

සීයා, *n.* grandfather (*pl.* සීයාලා)

සිරද(or ඳ), *n.* noble or great lion

සිරලු-ඩ්‍ය, *n.* man who has forsaken the Buddhist priesthood

සිරස්(or ස්ස), *n.*=සිරස්ස

සීරා(*b.*), *n.* plough, cricket (insect)

සිරාමාරා-ව, *n.* carefulness, steadiness, decency

සීරා-ව, *n.* good state or condition, decency, order (*T.*)

සිලර, *vi.* to be scratched or scraped off (සීරාණු)

සිවාල, *n.* an aquatic plant (*vallisneria*);=සිවාල

සිහස්-ය, *n.* sense, recollection

සීස-ය, n. lead

සීසා, *vt.* to plough, to till (සීසා)

සු, *up.* well, good, excellent, easily, perfectly

සුක්කානම(ම), *n.* helm, rudder (*T.*)

සුකම, *n.* merit, virtue of good work

සුකර, a. easy to be done, practicable

සුකු, *n.* tax, tribute [young

සුකුමාර, a. very delicate or soft, beautifully

සුකුරා, *n.*=සිකුරු

සුකෘත, *a.* done well or properly

සුකෘතිය, n. good act, kindness

සුඛ-ය, n. happiness, joy, well being, health

සුඛාවහ, a. conducive to happiness, comfortable

සුඛිත, a happy, delighted

සුගත්(*b.*), *n.* epithet of Buddha

සුගත, a. well gone or passed. n.=සුගත්

සුගතාගම(ය), n. Buddhist religion

සුගතේන්ද්‍ර(*b.*) *n.* pre-eminent Sugat

සුගති-ය, n. heaven, happy state

සුගඳ, *n.* good smell, odour

සුගන්ධ-ය, n. fragrance, odour

සුගන්ධි, a. sweet smelling, fragrant. n. -ය, perfume, fragrance

සුගම, a. easy of excess, easy, plain

සුගී-ය, *n.* heaven. *n.*-සැප-ය, happiness in heaven

සුගුණ-ය, n. good virtue or quality

සුගෘහීත, a. held well or firmly [quantity

සුඟ, *n.* top, small quantity, little, considerable

සුඟක්, *a.* small, little

සුඟු, *n.* assafœtida (පෙරුංකායම්)

සුචරිත-ය, n. good conduct, virtuous deed

සුජන-නා, *n.* good or virtuous man, gentleman
සුණ, *vt.* to hear
සුණංගු, *a.* late, slow (*T.*). *vt.* -කරය, to delay
සුණු, *n.* powder, flour, lime
සුණුකම(or ව)ඩ(ඩු), *n.* work done with lime
සුණුකර, *vt.* to reduce to powder, to destroy
සුණුගල(ල්), *n.* limestone
සුණු-සුණුකර, *vt.* to reduce to utter ruin
සුත්, *a.* white (*v.* සුදු)
සුත(or ත්‍ර)(*b.*), *n.* son, thread, rule, Sutra
සුත්‍රය(ය), *n.* thread, rule, Sutra
සුද්ද, *a.*=සුදු. *vt.* -කර, to clean, to purify
සුද්දා(සුදා), *n.* white man (*pl.* සුද්දෝ) [father (*P.*)
සුද්ධෝදන(*b.*), *n.* name of Gautama Buddha's
සුදු(දු), *n.* colour white, purity
සුදුගෙය(*b.*), *n.* harem, seraglio [the body
සුදුසඳුන, *n.* ako. white fragrant unguent for
සුදු සැදීම(or යාම)(ම), *n.* gleet, fluor albus
සුදෙ(*b.*), *n.* council or assembly of the gods
සුදස්සා(ස), *n.* name of one of the Brahma worlds [discus of Vishnu
සුදසුන්, *a.* good-looking, hand-some. *n.* (*b.*)
සුදී(*b.*), *n.* wise or learned man, pandit
සුදු(*b.*), *n.* man of the *Sudra* caste, low man, hunger, colour white. *a.* white

සුදුකඳ, *n.*=කිරිබදු

සුදුකර, *vt.* to make white

සුදුද්දස, *n.* epithet of Nirvana

සුදුදුරු, *n.* white cumin seed

සුදුපාට, *n.* colour white

සුදුපිත්තල, *n.* ako. bell metel

සුදුපුරුක්, *n.* a plant (*justicia betonica*)

සුදුබිත්දද, *n.* ako. spurge (*euphorbia thymi-folia*)

සුදුබුදදකිරිය, *n.* ako. spurge (*euphorbia pilu-lifera*)

සුදුමැලි, *a.* pale

සුදුර්ලභ, a. very scarce or rare

සුදුරත(යු), *n.* light red colour

සුදුරු.(*b.*), *n.*=ශුද්ධා

සුදුලීකත්, *n.* a tree (*phyllanthus cyanospermus*

සුදුළූනු, *n.* garlic (*allium sativum*)

සුදුහඳුන්, *n.* white sandal wood

සුදුසිඳු(*b.*), *n.* milky (white) ocean, white horse

සුදුසු, *a.* fit, proper

සුදූර, a. very distant or far

සුධාබුත්(*b.*), *n.*=සුරභොජන

සුධම්මා(*b.*), n.=සුදම්

සුධා(*b.*), n. whitewash, plaster, mortar, nectar [embrosi

සුධාධවල, a. white with plaster or mortar

සුධී(*b.*), n.=සුදී

සුන්, *a.* empty, decocted, thin, fine, cut

සුන්කර, *vt.* to cut, to destroy

සුන්තුරා(*b.*), *n.* axe

සුඳර, a. lovely, beautiful

සුඳරී, n. beautiful woman (*pl.* සුන්දරීයෝ)

සුන්නා(සුණු), *n.*=හුන්නා (*v.* සුණු)

සුන්පිව, *n.* mirror, looking-glass

සුන්බග, *a.* broken, cut. *n.* quarrel [broken

සුන්බුන්(*b.*), *n.* small ware, lumber. *a.* cut and

සුන්වත්(*b.*), *n.*=සුංතාමි

සුන්සාල්, *n.* pulverized or broken rice

සුන්හිස්(*b.*), *n.* ako. metre, head cut off

සුනක-යා, *n.* dog. (*ld.* සුනකයෝ)

සුනඛ-යා, *n.* (Pali form of ශුනකයා, dog)

සුනිම්ල, a. perfectly pure

සුනිල්, *a.*=සුනීල

සුනු(*b.*), *n.* lizard, son (*v.* සුණු)

සුනෙව(*b.*), *n.* epithet ot Vish*n*u

සුමෙර, *n.* Maha*m*eru

සුප්, *n.* soup (*E.*)

සුප්‍රතිෂ්ඨිත, a. well-established or fixed, firm

සුපක්ව, a. well-cooked, thoroughly matured

සුපරිශුද්ධ, a. perfectly pure or holy

සුපැතුම(මි), *n.* good hope or wish

සුපිත, *a.* well-blossomed

සුපිපි, *a.* well-blown (us a flower)

සුප්පතිට්ඨ, *a.* = සුප්‍රතිෂ්ඨිත
සුප්ත(*b.*), *n.* sleep, repose, dream
සුපුන්, *a.* full, complete
සුපිපුල්, *a.* well-blown (as a flower)
සුබ, *a.* = ශුභ
සුඹස(ස්), *n.* white ant hill
සුඹුන්කා(සුඹුළු), *n.* jaw
සුඹුලු-ඹ, *n.* bark or rind of trees, tegument, tunicle, hempen cloth, coil or pad of cloth
සුභග, a. very happy or fortunate
සුභාෂිත, a. spoken well. n. -ය, fine speech, apposite saying, name of a Sinhalese poem
සුභික්ෂ-ය, n. plenty, abundance of food
සුම්මැඩි-ද, *n.* = දරණුව
සුමග, *n.* good road
සුමඟුල්, *a.* = සුමංගල
සුමංගල, a. very auspicious [position
සුමති, a. very wise n. -ය, good mind or dis-
සුමන්ද්‍ර-ඩ, *n.* difficulty, trouble, disturbance
සුමන, a. very charming, lovely, good-minded, n. (*b.*) name of the god of Adam's Peak, great flowered jasmine
සුමාන-ය, *n.* weak (*Pg.*)
සුමිතුරා(රු), *n.* good or faithful friend
සුමිහිරි, *a.* very sweet

සළි(*b.*), *n.* multitude, heap, one whose senses are curbed

සළුඟ(ඟු), *n.* casket

සුමිදු, *a.* very soft or smooth. *n.* (*b.*) sea, ocean

සුමිලස්(*b.*), *n.* cook

සුමේධ, a. wise, intelligent

සුරනා(or නිඳු), සුරපති, } (*b.*) *n.* epithet of Sakra

සුරපා, *n.* = සුරපුර

සුරපුර-ය, n. celestial city, heaven

සුරබි(*b.*), *n.* = සුරභි

සුරඹ(ඹු), *n.* celestial nymph

සුරභි, a. sweet smelling, fragrant, pleasing. *n.* (*b.*) fragrance, cow of plenty

සුරමග, *n.* sky, firmament

සුරමාණ, සුරමිණ(ණි), } *n.* = සිතුමිණ

සුරරජ(or ද)(*b.*), *n.* epithet of Sakra

සුරරි(or රා)පු(*b.*), *n.* Asura (demon)

සුරලො-ව, *n.* world of gods, heaven

සුරවම්, *n.* celestial nymph, goddess

සුරවර(*b.*), *n.* epithet of Sakra

සුරවරණ(*b.*), *n.* elephant of Sakra

සුරවි-ය, *n.* rainbow

සුරසතුරා(*b.*), *n.* Asura (demon)

සුරසාවි(වි), *n.* rainbow

සුරසිඳු(b.), n.=අහස්ගඟ

සුරල(ල්), n. a particular mode of bea drum with the fingers

සුරා(b.), n. toddy, spirituous liqu

සුරාචාර්‍ය්‍ය-යා, n. epithet of Brihaspati

සුරාධූර්ත-යා, n. drunkard, sot

සුරාපාන-ය, n. drinking of spirituo

සුරැකි, a.=සුරක්ෂිත

සුරැජ(or ඳු)රා(රු), n. epithet of Brihaspa

සුරිඳු(b.), n. epithet of Sakra

සුරිඳුසැව(වි), n. rainbow

සුරු(b.), n. hero, strength, sun

සුරුත්කම(ම්), n. speed, carefulness, econom

සුරුකම (ම්), n. skill, ability

සුරුකු, a. resembling, like

රුවිටු-ව, n. cigar, roll (T.)

සුරුතල්, a.=සුරතල්

සුරුබුහුටි, a. of small make, well-propo

සුරුවම(ම්), n. image (T.)

සුරේන්ද්‍ර(b.), n.=සුරිඳු

සුල්තාන්(b.), n. Sultan (M.)

සුල, a. friendly. n. torch, flambeau

සුලඟ, n. wind, breeze

සුලඟිල්ල(-ඟිලි), n. little finger

සුලබ, a. } easy to obtain or meet with
සුලභ, a. } tiful

සුලම්, *n.* friendship, intimacy

සුලං, *n.* (form of සුලඟ used before other nouns)

සුලා(ල), *n.* friend, companion

සුලි-ය, *n.* whirpool, curl, curve, deceit (*T.*)

සුලු(*b.*), *n.* nature, disposition (*v.* සොභාව)

සුලු (or ළු), *a.* small, little, insignificant

සුලුකැඳ, *n.*=උරිකැඳ, gruel

සුලුකූර, *n.* ako. amaranth (*amarantus poly-* [*gamus*)

සුලුදිය, *n.* urine

සුලුප්පු-ව, *n.* sloop (*E.*)

සුලුපස්මුල(ල්), *n.* the five minor roots (*viz.* එලබටු, කටුවැල්බටු, අස්වැත්ත, පොල්පලා, and ගොකටු)

සුලුපිරැද, *n.* ako. hog-weed (*boerhavia diffusa*)

සුලුවග, *n.* name of the third division of the Vinaya Pitaka

සුව(*b.*), *n.* parrot, dog (*v.* සුවය)

සුවකර, *vt.* to heal, to cure

සුවච, a. obedient, docile

සුවට, *a.* very round, globular

සුවණ(*b.*), *n.* bird Garuda, 22nd lunar asterism

සුවත(ත්), *n.* good road

සුවතුරා, *n.*=මාරු, මදවිස

සුවඳ, *n.* good smell, scent

සුවඳතලා, *n.* a plant (*ocimum basilicum*)

සුවදකොට, n.=සාමාන්‍ය
සුවදැල්, n. ako. paddy, ako. plantain
සුවන(b.), n. bird Garuda, dog, gold
සුවණ්ණකාර-රා, n. goldsmith (pl. සුවණ්ණකාරයෝ)
සුවන්බා, n. twilight, dawn
සුවණ්ණ(or නැ)න(b.), n. epithet of Vishnu
සුවපත්, a. healthy, happy
සුව-ය, n. health, cure (v. සුවය)
සුවශ්‍රී, n.=සෞශ්‍රී
සුවරා(b.), n. goldsmith, cook
සුවසදුණු, n. natron, alkali
සුවසේ, ad. in health, happily, comfortably
සුවිසෙය(ස්), n. hundred thousand, lac
සුවාසුදහස(ස්), n. eighty-four thousand
සුවිනීත, a. well-trained, docile
සුවිපුල, a. large, great, bulky
සුශ්‍රැත-ය, n. name of a medical work
සුශික්ෂිත, a. docile, well-trained
සුස්ම, n. breath, breathing
සුසජ්ජිත, a. well prepared or adorned
සුසාන-ය, n. cemetery, burying-ground (P.)
සුසිර, n. wind instrument, lute
සුසුම(or රුස්), n.=සුවඳිනා
සුසු, ij. noise made to drive away a rat, etc
සුසුම්ල, vt. to sigh(සුසුම්ලා)

සුසුම(ම්), *n.*=සූක්ෂ්ම
සුසුර(රා), *n.* proboscis, hole
සුහද(*b.*), *n.* good heart, friend
සුහුද(*b.*), *n.* friend, cook
සුහුනා(නු), *n.* lizard, son
සුහුඹුල්, *a.* growing luxuriantly
සුහුරුබඩු(*b.*), *n.* brother-in-law
සුහුරල්(*b.*), *n.* mother-in-law
සුහෘද්(*b.*), n. friend, ally
සුළු, *a.*=සුළු
සුංගම(ම), *n.* tax (on merchandise, etc.) [*mus*]
සුංගා, *n.* ako. sheat fish (*silurus pungentissi-*
සූ(*b.*), *n.* condiment, curry. *a* four. *ij.* hush!
සූක්ෂ්ම, a. minute, fine, subtle
සූකිරි, *n.* sugar candy (*D.*)
සූචික-කා, n. tailor (*pl.* සූචිකයෝ)
සූචි-ය, n. needle, index, piercing
සූචික්කා(-චික්), *n.* sun bird [sardine
සූඩ-ඩා, *n.* ako. small sea fish, anchovy,
සූත්‍ර-ය, n. thread, rule, aphorism, dicourse of
Buddha. a. -පිටක-ය, the first of the three divisions (or Pitakas) of Buddhist scriptures
සූද-යා, n. cook (*pl.* සූදයෝ)
සූදානම(ම), *n.* preparation, readiness, care (*T.*)
සූදු-ව, *n.* gambling (*T.*). *n.* -කාර-යා, gambler

සූදුකෙළි, *vt.* to gamble. *n.* -ය, gambling
සූපදෙව(*b.*), *n.* chief cook
සූනා(නු), *n.* lizard (සූනක්) [ruin a person (*T.*)
සූනියම(මේ), *n.* ako. witchery, incantation to
සූනු(*b.*), n. son [cook. n. -ශාස්ත්‍ර-ය, cookery
සූප-ය, n. soup, sauce, condiment. n. -කාර-යා,
සූර්යකාන්ත, n. ako. crystal, a plant (*hibiscus phœniceus*) [sunshine
සූර්යකාන්ති, n. sunflower (*helianthus annuus*),
සූර්යයා, n. sun. n. -ග්‍රහණ-ය, eclipse of the sun
සූර්යෝදය-ය(*b.*), n. sunrise
සූර, *vt.* to scratch, to scrape off (සීරා)
සූර-යා, *n.* shrewd man, cunning man
සූරිය, *n.* tulip tree (*thespesia populnea*)
සූරියමාරා, *n.* a tree (*albizzia odoratissima*)
සූලක්ෂ, *n.* four lacs
සූත්තර-ය, n. (*ifo.* සූත්‍රය) machine, contrivance
සූසැට, *n.* sixty-four
සෙ, *n.* colour white, shadow. *vi.* to laugh (සිනා)
සෙක්කු-ව, *n.* oil-press, chekkoo (*T.*)
සෙකුරතාරිස්(*b.*), *n.* secretary (*D.*)
සෙට්ටි-යා, *n.* a class of Indian traders and money lenders, Chetty
සෙට, *a.* chief. *n.* tomorrow
සෙක්කිඹුමාලු-ව, *n.* court-yard

සෙත්පුර, *n.* epithet of Nirvana

සෙත(ත්), *n.* tranquility, happiness, Nirvana

සෙනිජ(*b.*), *n.* deer

සෙද,
සැදල්, } *ad.* quickly, soon, at once

සෙද(or සෙද or සෙදු)ල, *n.* crane

සෙදහල්, *ad.*=සෙද

සෙදාගාමි, *a.*=සකදාගාමි, walking in the second path to Nirvana

සෙන්(*b.*), *n.* multitude, army, kite

සෙන්දිරික්කා, *n.* a plant, four o'clock flower, marvel of Peru (*mirabilis jalapa*)

සෙන්පා(or වා),
සෙන්හිතා, } (*b.*) *n.* general (of an army)

සෙන, *n.* thunderbolt. *prpa.* laughing

සෙනගහ, *vi.* to be struck by lightning

සෙනඟ, *n.* multitude, army

සෙනරත්, *n.*=මොනරකුඩුම්බිය

සෙනසුන(න්), *n.* dwelling, residence

සෙනසුරා, *n.* Saturn. *n.* -දා, Saturday

සෙනෙවි,
සෙනෙවිරත්, } (*b.*) *n.* general (of an army)

සෙනෙහස, *n.* love, affection

සෙනෙහෙ, *n.* love, senna leaves

සෙප්පඩ(or ඩි)විජ්ජා-ව, *n.* deceit, trickery, juggling

සෙප්පම(ම්), *n.* health, ease, enjoyment

සෙප්පු-ව, *n.* casket, small box (*T.*)

සෙපත්(or තු)(b.), n.=සාංසා

සෙබඩා(ඩ or ඩු), n. peahen

සෙබළා(ළ), n. shrewd soldier, warrior

සෙම්ප්‍රතිශ්‍යාය-ව, n. cold, catarrh

සෙම්බුනෙරිංචි, n. a plant (*tribulus terrestris*)

සෙම්බු-ව, n. copper pot

සෙම(මි), n. phlegmatic humour, peace, tranquility

සෙමර, n. tail of සෙමරා, chowrie

සෙමරා(ර), n. Indian yak (ako. deer)

සෙමිණ(ණි), n. crystal

සෙමි(or සෙම)න්, n.=*ad.* slowly, gently, peaceably

සෛමරා, etc.=සෙමරා, etc.

සෙයන-ව, n.=ශයනාව (*F.*)

සෙයින්, n.=*ad.* like, -ly (as in, බොහෝ
සෙයින් 'abundantly', 'largely'). It is incor-
rectly used for හෙයින් 'because', 'as'

සෙයිලම(ම), n. Ceylon (*Pg.*)

සෙර, n. female thief (*f.* of සොරා)

සෙරෙප්පු-ව, n. one of a pair of sandals (*T.*)

සෙල්(*b.*), n. mountain, stone, rock, declivity,
chaff, cloth, colour white

සෙල්හාර, n. twine

සෙල්මුවා, *a.* made of stone

සෙල්ල, n. spear, lance (*v.* හෙල්ල)

සෙල්ලම්කර, *vt.* to play, to sport

සෙල්ලම(ම), *n.* sport, pastime, amusement (*T.*)
සෙල්ලෙල(or වෙ), *vi.* to move, to shake (සෙල්ලු(or ලු)ණු)
සෙල(ල්), *n.* (*v.* සෙල්)
සෙලවෙ, *vi.* to shake, to move (සෙලවුණු)
සෙලු(*b.*), *n.* nakedness, naked ascetic, naked man, bird
සේවන්දි(*b.*), *n.* amethyst, rose (*T.*)
සේවිත, *ppa.* served or attended by
සේවු-වා, *n.* servant, attendant
සෙවණ, *n.* shade, shelter [*ma*)
සෙවණැඹිලිය, *n.* ako. fig tree (*ficus asperri-*
සෙවණැල්ල(-ණැලි), *n.* shadow
සෙවිලි-ය, *n.* coolness, shade, covering
සෙවත(ත්), *n.* female enemy, chaste woman, wages for servants
සෙවල(ල්), *n.*=සෙවෙල
සෙවලා-ව, *n.* white cloud (*v.* සෙවෙල)
සේවි(*b.*), *n.* sorrow. *ppa.* associated with, served
සෙවි(or වු)ම(ම්), *n.* (*go.* සොය) searching, covering roof
සෙවු(*b.*), *n.* sorrow, parrot. *ppa.*=සේවි
සෙවෙ, *vi.* to be entwined, to be covered up, to be sought after (සෙවුණු)
සෙවෙලි-ය, *n.*=සෙවිලිය

සෙමෙවක(ක්), n.=සෙවක
සෙමෙවති, vt. they associate with or serve
සෙවෙල්, n. moss, an aquatic plant (*vallisneria octandra*)
සෙවෙ(or වු)ල(ල්), n. slime, any thing slimy
සෂය(සෙසු), n. remainder
සෙසු, a. remaining
සෙහෙව, n. young woman, maid
සෙංකල-ය, n. knuckle, shin, shank (*D.*)
සෙංකොට්ටෙ, n. marking nut (*T.*)
සෙංගමාල-ය, n. jaundice (*T.*)
සේ(*b.*), n. colour white, ray of light, manner, likeness, shadow, soldier, learned and wise man. a. clever, learned. n.=ad. at once, quickly; like, -ly (as in දුකසේ, inconveniently, difficultly); to (as in යන සේ, to go) (v. සෙ)
සේක්, respectful ending of a verb
සේක, a. clever; respectful ending of a verb
සේකර(*b.*), n. moon
සේචන-ය, n. sprinkling, watering, effusion
සේතුබන්ධ-ය, n. forming or constructing a bridge, ridge of rocks extending from the Southern extremity of the Coromandel coast towards Ceylon (said to have been built

for Rama's passage to Lanka by Nala and other monkeys), any bridge or cause-way

සේතු-ව, n. bank, cause-way, dam, bridge, fixed rule or law

සේද, *n.* silk, satin (*Pg.*)

සේදී(or දු)ම(මි), *n.* (*go.* සෝදය) washing

සේදෙය, *vi.* to be washed (සේදුනු)

සේත්තුකර, *vt.* to balance any account, to deduct, to put in place of

සේන්දුවෙ, *vi.* to arrive at, to reach

සේන(න්), *n.*=ශයන; reclining, reposing

සේනාධිපති-යා, n. general or leader of army

සේනාපති-යා, n.=සේනාධිපතියා

සේනා-ව, n. army, host [(*P.*)

සේඵාලිකා, *n.* a plant (*nyctanthes arbortristis*)

සේම, emphatic form of සේ 'like', 'as'

සේරිසි(සී), *n.* crystal

සේර, *n.* a vegetable plant used in cooking [beef, etc.

සේරදඩිය, *n.* rest for a plate from which one eats

සේර(or රා)ම, *pr.* all, whole

සේර(or රු)ස(*b.*), *n.* moon

සේරු(ර), *n.* wild duck, teal (*dendrocygora javanica*) (*pl.* සේරු)

සේච්ඡාචාරිකා-ව, *n.* freedom, liberty to go any- [where (*P.*)

සේට්ටුකාරයා, *n.* hawker, travelling merchant

සේරු-ව, *n.* grain measure (equal to one thirty-second part of a bushel)

සේල-ය, *n.* cloth, dress

සේලු, *n.* a tree (*cordia myxa*)

සේව්‍ය, a. to be served or waited upon

සේවක, a. serving, worshipping, dependant. n. -යා, servant, dependant, votary

සේවන-ය, n. act of serving, service, associating with

සේව-ය, n.=සේවනය

සේවාපත්‍ර-ය, n. army, military service

සේවා-ව, n. service, worship. vt. -කරනවා, to serve as a soldier. n. -කම(ම), military service [වාගෝ)

සේවා-යා, n. soldier, lascoreen, peon (*pl.* සේ

සේවාරාල, n. (resp. form of සේවායා)

සේසත(ත), *n.* white umbrella (one of the insignia of royalty), all possessions of a man

සේසුරු(*b.*), *n.* Saturn

සේසඳ(ස), *n.* white coloured swan

සෛංහල(or ල), *a.* belonging to, growing or produced in Ceylon

සෛන්ධව(*b.*), n. ako. rock-salt [in Sindhu)

සෛන්ධව-යා, n. horse (especially one bred

සොකඩ-ය, *n.* clappers of bambu, etc., tied around the necks of cattle [සොකඩයෝ]

සොකඩ-යා, *n.* weak or feeble person (*pl.*

සොච්චම(ම්), *n.* balance, remainder (T.)

සොච්ච, *a.* crippled or deformed

සොට, *n.* snout, beak, mouth (*pl.* සොටවල්)

සොටි-ය, *n.* spear, dart, missle

සොටු, *n.* mucus of the nose

සොඬ, *n.* snake poison, proboscis, a plant (සොඬල). *a.* longing, fond of

සොඬල, *n.* a plant (*modecca palmata*)

සොඳ, *a.* good, pleasing, agreeable

සොඳුර(or රී), *n.* woman, one's own wife

සොඳුරා, *a.* good, pleasing, agreeable

සොඳේ=is good

සොබන(or මත්), *a.*: pleasing, beautiful, shining

සොබි, *vi.* to be fit, to suit

සොම්නස(ස්), *n.* joy, delight

සොම්මරු(රා), } *n.* man who works in leather
සොම්මාර-යා, }

සොමි(*b.*), *n.* moon, planet Mercury, north. *a.* mild, gentle. n. -දින, Monday

සොමිද, *n.* semen virile (*v.* ශුක්‍රධාතුව)

සොමිඳුර(රා), *n.* likeness of the moon

සොම්බල-ය, *n.* (*ifo.* සම්බල)

සොලුකර, *vt.* to smooth by rubbing, to polish

සොය, *vt.* to seek, to examine, to cover (roof of a house) (සෙවූ)

සොර, *a.* thievish, stolen

සොර, *n.* a tree (*dipterocarpus zeylanicus*)

සොරකම්කර, *vt.* to steal, to rob

සොරකම(ම්), *n.* theft, robbery

සොරය, *n.* jail, prison

සොරස, *n.* juice, vital part of any thing

සොරා(ර), *n.* thief, robber (*pl.* සොරු)

සොරොව්-ව, *n.* drain, sewer, sluice

සොල්, *a.* useless, unprofitable

සොල්දර, *n.* upstair (*D.*)

සොල්දාදු-වා, *n.* soldier (*pl.* සොල්දාදුවෝ) (*Pg.*)

සොල්මන(න්), *n.* shaking, sound made by; an evil spirit

සොල්මනා(න්), *n.* ako. scarecrow

සොල්ල, *vt.* to shake (සෙල්ලූ)

සොලව, *vt.* to shake (සෙලෙවූ)

සොලොවිස්-ස, *n.* clasp, lock (*D.*)

සොලෝ-ව, *n.* stanza

සෝ-ව, *n.* sorrow

සොවැසි-ය, *n.* one of two marks in the hood of the cobra, ako. house [tomb

සොහොන(න්), *n.* cemetery, cremation ground,

සොහොන්ගොව්-වා, *n.* cemetery-keeper

සොහොන්පල, *n.* graveyard, cremation ground
සොහොයු(or වු)රු(රා), *n.*=සහෝදරයා
සොළ(or ළො)ස(ස්), *n.* sixteen
සොළොස්කලා-ව, *n.* sixteen digits of the moon
සෝ(*b.*), *n.* sorrow, ear, stream, sweat, swelling
සෝඩි-ය, *n.* alphabet
සෝතාපත්ති-ය, *n.* (*P.* form of ස්‍රොතාපත්තිය)
සෝද, *vt.* to wash (සේදූ)
සෝදුළ, *n.* mucus of the nose
සෝදිසිකර, *vt.* to examine, to investigate
සෝදිසි-ය, *n.* investigation or inquiry
සෝත(ත්), *n.*=සොහොන
සෝප්පි-ය, *n.* dram of spirituous liquor (*D.*)
සෝපකාර, a. assisted, befriended
සෝපද්‍රව, a. visited with calamities
සෝපාන-ය, n. staircase, ladder
සෝපා-ව, *n.* sofa (*Pg.*)
සෝම(*b.*), n. name of a plant, its juice, [nectar, moon
සෝමන(ත්), *n.* coloured cloth worn by men (*T.*)
සෝමවංශ-ය, n. lunar dynasty
සෝමවාර-ය, n. Monday
සෝර්ටි-ය, *n.* kind, sort (*Pg.*)
සෝල්දුකර, *vt.* to out, to carve
සෝල්දලි-ය, *n.* walking stick
සෝලි-ය, *n.* injury, harm, fault

සෝවාන්(*b.*), *n.* first of the four stages to [Nirvana
සෝවෑති-ය, *n.*=සොවෑතිය
සෝතම(ම්), *n.* cuticle
සෝලස(ස්), *n.*=සොළස
සෞඛ්‍ය-ය, n. pleasure, happiness, felicity
සෞගත-යා, n. Buddhist
සෞගන්ධ, a. sweet-scented, fragrant
සෞන්දර්‍ය-ය, n. beauty, loveliness, elegance
සෞභාග්‍ය-ය, n. good fortune or luck, grandeur
සෞම්‍ය, a. pleasing, soft. n. (*b.*) planet Mercury
සෞම්‍යධාතු-ව, n. phlegmatic humour, phlegm
සෞමනස්‍ය-ය, n. pleasure, delight
සෞම්‍යත්ව-ය, n. (*ifo.* සෞම්‍යත්වය)
සෞර, a. relating to the sun, solar [valour
සෞර්වීර්‍ය-ය, n. (*ifo.* ශෞර්‍යවීර්‍ය) heroism,
සෞරාෂ්ට්‍ර-ය, n. Surat (in India)

හ.

හ, 33rd cons. of the Sinh. alp. equals *h* in 'hut' and takes the following forms when combined with the 18 vowels :— හ, හා, හැ, හෑ, හි, හී, හු, හූ, හෘ, හෲ, හෟ, හෳ, හෙ, හේ, හෛ, හො, හෝ, හෞ
හුදන(*b.*), n. (*ifo.* හෘදය)
හ්‍රස්ව, a. short, dwarfish

ශ්‍රීවෙර, n.=ඉරිවෙරිය

හලාද-ය, n. pleasure, joy

හ, n. (bo. හය, six). a. -වෙනි, sixth

හක්(b.), n. conch-shell (v. සක්)

හක්ක(-හක්කු), n. jaw

හක්ගෙඩි-ය, n. conch-shell

හක්මණ(ක්), n.=සක්මණ

හක්මන්කර, vi.=සක්මන්කර

හක(ක්), n. chank or conch-shell

හකු, n. (bo. හක්ක). n. -පාඩා-ව, joint of the jaw

හකුරා(රු), n. man of the jaggery caste (pl. හකුරෝ. f. හකුරී)

හකුරු, n. jaggery, pebble (v. සකුරු)

හකුල, vt.=අකුල (හැකුළු)

හගිස්ව, vt.=හාගිස්ව

හග(ක්), n. end (v. අග)

හඟ, n. horn (pl. හං) (v. අඟ)

හඟරම්මා(ම්), n. a class of Sinhalese people included in the jaggery caste (pl. හඟ රම්මු) [dancer

හඟල(ල්), n.=අඟල; a form of dress used by a

හඟව, vt. to cause to be known, to indicate, to conceal (හැඟෙවු)

හඟි, vt. to think (හැඟි)

හඟුන, n.=අඟුන

හැකුළු(b.), n.=අකුළුම, අකුල; mud [together
හඟුල(ළ), n. double boat, two canoes tied
හට්ටි-ය, n. earthen cooking vessel [ගණී)
හටගණී, vt. to be produced, to originate (v. අට
හැටන(ත්), n.=සටන [weep (හැඬූ) (v. අඬ)
හඬ, n. sound, noise, voice. vi. to cry, to
හඬගහ, vt. to call out (හැඬගැසූ) (v. අඬගහ)
හණ, vt. to mix, to knead (හැණු) (v. අන)
හණ, n.=ශණ. n. -නූල(ල්), hempen thread
හණගල(ල්), n. rub-stone, whet stone
හණස්ස(-ණසු), n. bract of the cocoanut flower
හණික, ad. quickly, at once
හත්(b.), n. hand, western rock, cubit, cubit measure, seven (v. අත්)
හත්කම(ම්), n. handicraft, manual work
හත්තිර(රි), n.=අත්තිර
හත්ත(හතු), n. mushroom; (හති) panting
හත්තන, n.=අත්තන
හත්ති-ය, n. hat made of bamboo leaves worn by Kandian workmen, strength
හත්හි, ad. around
හත්වන, n.=අත්වන; a. seventh
හත්තෙස්, ad. speedily, quickly
හත(ත්), n.=හත්; 13th lunar asterism
හත, a. killed, injured, destroyed

හතර, *n.*=සතර

හතරමංසන්ධි-ය, *n.* place where four roads meet

හතරැස්, *a.* square. *n.* -කොටු-ව, square part of a Dagæba

හතළිස(ක්), *n.* forty

හතිදම, *vt.* to pant (හතිදැමු)

හති-ය, *n.* panting, loss of breath (*v.* හත්ත)

හතු(*b.*), *n.* western rock, 13th lunar asterism, destruction, cubit, mushroom

හතුරා(රෝ), *n.* enemy (*pl.* හතුරෝ) (*f.* හතුරී)

හතුරුකම්කර, *vt.* to do an unfriendly act

හතුරුකම(ම්), *n.* enmity

හත්දින්න(-දින්), *n.* the Pleiades

හද, *n.*=හෘදය. *a.* -වැති, affectionate

හද, *vt.* to make, to prepare (හැදූ) (*v.* හද)

හදස්(*b.*), *n.* mark, spot, male organ

හදවත(ත්), *n.* heart, breast

හදව, *vt.* to cause to make (හැදෙවු)

හදාර, *vt.* to recite, to learn (හැදෑරූ, හදාළ)

හදාළ, *ppa.* (from හදාර) recited, learnt

හදැති, *a.* affectionate, kind

හදි-ය, *n.* enmity, treachery. *vt.* -කර, to injure

හදිස්සි-ය, } *n.* accident, suddenness- හදිස්සි
හදිසි-ය, } යෙන්, suddenly, unexpectedly

හඳ, *n.* moon. *n.* -පාන(ත්), moon-light

හඳපත්තිල, *n.* hedge-hyssop (*gratiola cordifolia*)

හඳහණ(ත්), *n.* horoscope

හඳුදා, *n.* Monday

හඳුන්, *n.* sandal wood (*v.* සඳුන්)

හඳුනා, *vt.*=හැඳිනා

හඳුම්පත(ත්), *n.* breast

හන්, *a.* dressed, blunt. *n.* (*ifo.* හම්)

හන්, *ad.* at once, quickly

හන්දා, *prep.* on account of

හන්දි-ය, *n.* joint, junction. *vt.* -කර, to join

හන්දිරන්, *n.* ako. paddy

හන්දුරා(*b.*), *n.* a derisive term for ගොඩිගම

හන්නාලි-යා, *n.* tailor

හන්වඩු-ව, *n.* brand mark. *vt.* -ගසා, to brand

හනන-ය, n. killing, destroying

හනුකය, *n.*=සක්නෑබ

හනු-ව, n. jaw. n. -සුදිවු-ව, locked jaw

හනු(or නු)මත්(*b.*), **හනුමා**, } n. name of a powerful monkey-chief

හප්ප, *vt.* to cause to strike against (හැප්පු)

හප, *vt.* to chew, to bite (හැපු) (*bo.* හපය)

හපන්, *a.* clever. *n.* -කම්(ම්), cleverness

හපනා(ත්), *n.* clever man (*pl.* හපන්නු)

හප-ය, *n.* refuse of what is chewed

හපාකා, *vt.* to bite (හපාකෑ)

හපු, *n.*=සපු

හපුස්(*b.*), *n.* horripilation

හබ, *n.*=අබ (*bo.* හබක)

හබක(ක්), *n.* trap with snare

හබ-ය, *n.* assembly, lawsuit, dispute. *vt.* -කර, [to quarrel

හබරල, *n.*=සබරල

හබරලි-යා, *n.* ako. sea fish

හබල(ල්), *n.* oar.

හබලපෙති(*b.*), *n.* beaten or flattened rice

හබුරා, *n.*=හබරල

හම, *vt.*=ඇමි (හැමු). *n.* water

හමව, *vt.* (*clfo.* හම)=ඇමව

හමා(or මේ), *part.* except, quickly

හමු(*b.*), *n.* water, mother

හම්, *n.* (*bo.* හම)

හම්පටගැසෙන, *vi.* to be wrinkled or to wear out with age

හම්පරඳාල්ල, *n.* a plant (*rottlera tinctoria*)

හම්පලඳ, *n.* a plant (*combretum decandrum*)

හම්පත්තා, *n.* a plant (*desmodium pulchellum*)

හම්පිල්ල, *n.* a plant (*flemingia strobilifera*)

හම්බකර, *vt.* to procure, to earn

හම්බවෙ, *vi.* to meet, to be found [හම්බාන)

හම්බා(or බ)-කාරයා, *n.* coast Moorman (v.

හම්බාන(න්), *n.* ako. dhony or sailing vessel

හම්බඩු-වා, n. flying squirrel

හම්බුපන්, n. a plant, reed mace (*typha angustifolia*)

හමා, vi. to blow (as the wind) (හැමු)

හම(ම), n. skin, hide. vt. -ගස, to flay, to skin

හමට, a. despicable, mean, swept (හැමදු)

හමදු, vt.—ඇමදු

හමස, vt. to equalise, to assimilate, to join

හමල, ppa. blown (of wind). n. assemblage

හමස්සොලපෙට්ටි-ය, n. waste paper basket

හමස්බා, n. ako. bean

හමා(ම), n. infirm and lazy man

හමාර, n. conclusion, half. vt. කර, to conclude

හමාස-ය, n. six months

හර්ම්‍ය(*b.*), n. mansion, nobleman's house

හඹු, n. ako. grain (අඹු)

හමු-ව, n. presence, before

හය(*b.*), n. horse. n. -මාර, fragrant oleander

හ-ය, n. six. a. -වෙනි, sixth

හර, vt. to open, to pull (හැරු)

හහිරි(or රී)පු(*b.*), n. buffalo

හයිකර, vt. to make strong or firm

හයි-ය, n. strength, force

හර, a. taking away, carrying, seizing. n. (*b.*) Siva, divisor, denominator of a fraction. n. string (of pearls etc.), garland, heart-wood

හරක්මස්(*b.*), *n.* beef

හරකම(ම), *n.* hardness, strength

හරකල්(*b.*), *n.* wife of *S*iva, Umayangan*a*

හරකා(න්), *n.* ox, bull (*f.* හරකී)

හරගිර(රි), *n.* mount Kail*a*sa (*S*iva's residence)

හරඩ, *n.*=කෑදැත්තා

හරණ-ය, n. seizing carrying way, removing

හරණැල්කටු-ව, *n.* hairpin (හරණැල් *D.*) [*umbet*)

හරන්කහ, *n.* wild turmeric (*curcuma zer-*

හරඹ, *n.* fencing. *vt.* -කර, to fence with the sword, to practise in fighting on foot

හරව, *vt.* to turn, to cause to leave (හැරෙවු)

හරස්, *a.* cross, transverse [passage

හරස්කප, *vt.* to stand across to obstruct the

හරස්තර, *vt.* to place across [crosswise

හරහ, *vt.*=හරන (හැරුහු). *n.* across. හරහට,

හරු-ම, *n.*=අරුම [correctly

හරි, *a.* right, just, exact. හරියට, properly,

හරි(*b.*), n. Vishnu, Indra or *S*akra, Yama, sun, ray of light, lion, snake, ape, horse, gold, tawny green or yellow colour

හරි, *vt.*=අරි (හැරිය)

හරිකම(ම), *n.* propriety, correctness

හරිකර, *vt.* to procure, to earn

හරිගස්ස, *vt.* to correct, to prepare (හරිගැස්සු)

හරිචන්දන, n. ako. yellow sandal wood, one of the five trees of paradise

හරිතුරඟ(*b.*), *n.* epithet of Sakra or Indra, sun

හරිද්‍රා, n. turmeric (කහ)

හරි-ය, *n.* side, part, extent

හරිල, *vt.* to meet, to find (හරිලෑ)

හරිසඳුන්, *n.*=හරිචන්දන

හරිහම්බකර, *vt.* to earn

හරීතකී, n.=අරළු

හල්, *n.* a tree (*vateria acuminata*), mark placed over a consonant when it is not combined with a vowel

හල්දුම්මල, *n.* resin of the hal tree

හල්පොත්ත-ය, *n.* outer verandah

හල්මෙඩ්ඩා, *n.* small flowered bead tree

හල්මිල්(or මී)ල, *n.* a tree (*berrya ammonilla*)

හල්ලු(*b.*), *n.* firefly

හලු(ලූ), *n.*=සාලුව. *vt.* හල, =හල (හැලූ)

හලකුණ(ණු), *n.*=හලකුණ

හලන්, *a.*
හලන්ත, a. } ending in a consonant

හලුම(ම්), *n.*=සළුම

හලල, *vt.*=ඇලල (හැලලූ)

හලභෘ(or භෘත), *n.* epithet of Balabhadra

හලහ, *vt.*=හලන

හලහල, *n.*=හලාහල

හලා(ල), n. firefly (v. කළාම්)

හලාහම, n.=හලායම

හලාහල-ය, n. deadly poison

හළු, n. ashes (අළු). a. like, resembling

හව්, a. all. n. amorous state

හව්කිරීම, n. verbal noun denoting action (as කීම 'saying', යාම 'going') (v. අධික්‍රියාව)

හවිරුද්ද(-රුදු), n.=හවුරුද්ද

හවඩි-ය, n. metal waist chain

හවා, vt. to curse (හැවු)

හවරිවලු, n. ako. bindweed (*ipomœa tridentata*)

හවරි-ය, n. tress of false hair worn by women, tuft of a bullock's tail

හවස(ස්), n. evening

හවී, n. tear

හවීල, vt. to strengthen (හවිලූ)

හවුරු(රු), n. parapet, town wall

හවුරුද්ද(-රුදු), n.=අවුරුද්ද

හවුල්කාර-යා, n. partner

හවුල්වෙ, vi. to become a partner, to join

හවුල(ල්), n. partnership, share (v. අවුල් vt.)

හස්(b.), n. seal, sealing, laughter, horse, image, swan, corn

හස්කර, vt. to stamp or seal

හස්කර(b.),
හස්කරු-වා, } n. husbandman, cultivator

හස්ත, a. belonging to the hand, done with [the hand

හස්ත්‍යාලංකාර-ය, n. housings of an elephant

හස්ත්‍යශ්ව, n. elephants and horses

හස්තිපෝෂක-යා, n. elephant keeper

හස්ත්‍යාරෝහක-යා, n. elephant rider or driver

හස්ත, n. (bo. හස්තය)

හස්තකර්මාන්ත-ය, n. handicraft, manufacture

හස්තගත, a. (ifo. අහස්තගත)

හස්තතල-ය, n. palm of the hand

හස්තප්‍රාප්ත, a. gained, obtained

හස්තපුට-ය, n. concavity of joined hands (in the attitude of worship) [hand

හස්තමුද්‍රා-ව, n. indication of sentiment by the

හස්ත-ය, n. hand, trunk of an elephant, fore-arm, cubit

හස්තාමලක-ය, n. 'fruit of the myrobalan held in the hand' (an expression used to denote that which can be clearly and easily seen or understood)

හස්ති-යා, n. elephant (*f.* හස්තිනී)

හස්න(හසුන්), *n.* message, news, report

හස්පුණු, *n.* = අස්පුණු [agriculture

හස(*b.*), *n.* swan, sorrow, affliction, laughter.

හසර, *n.* road, path, moving about

හසර, *ppa.* repeated, said, associated with

හරම්බැඳි-ය, *n.* state of legs crossed when sitting

හලක්ෂර(රා), *n.* consonant

හසළ, *ppa.* learnt, instructed, familiar with

හසිත, a. laughed, expanded

හසුන(න්), *n.* seat, message, epistle

හසුරුව, *vt.* to cause to act or move, regulate

හැසුරුවණ(ණ්), *n.*=අසුරුවණ

හසුවෙ, *vi*=අසුවෙ

හහ(or හා), *ij.* ha! ha!! (expressing laughter)

හකි, *vt.*=සකි (කාඩන)

[from

හැළ(or රි), *ppa.* (from හැර) left, removed away

හළු, *n.* light, lustre, ashes (*v.* අළු)

හළුදු, *n.* turmeric

හළුම(ම), *n.* disappearing, vanishing

හළු-ව, *n.* cloth, shawl. *n.* -මයා, washer caste

හළුකල්ලා, *n.* tulip tree (*liriodendron liliifera*)

හංග, *vt.*=සඟව

හංපලදා, *n.* a tree (*terminalia parviflora*)

හංමිරු, *n.* ako. plant

හංස-යා, n. swan, flamingo

හා, *vt.* to plough (සා)

[vention

හා, *prep.* with, and. *ij.* hold! (expressing pre-

හාක්කු-ව, *n.* hook (*D.*)

හාතක්, *n.* a hairy plant (*justicia echioides*)

හාසර, *vt.* to join, to unite

[කිරීමු)

හාසිරව, *vt.* to get confirmed; to ascertain (සා-

හාකිල්ල, *n.* ako. bindweed (කිරිබිලු)

හාත්, *part.* around, surrounding;-ති, from around.

හාත්පස, *n.=ad.* around, completely

හාතණ, *n.* ako. panic grass (*panicum brizoids*)

හාතාවාරිය, *n.* a plant (*asparagus falcatus*)

හාද්ද(හාදු), *n.* kiss

හාද, *n.* friendship. *n.* -කම, friendship

හාද-යා, *n.* friend, associate (*pl.* හාදයෝ)

හාදු-ව, *n.* kiss

හාත්තෙරද්ද(-තෙරදි), *n.* swaddling cloth

හාන්සිපුටු-ව, *n.* easy chair

හාන්සිවෙ, *vi.* to lean or recline

හානිකර, a. causing loss, injurious. vt. to destroy, to cause loss

හානි-ය, n. loss, damage, decrease, privation

හාමත(ය්), *n.* weakness from hunger

හාමත(or යෝ), *n.* famine, scarcity of food

හාමි(*b.*), *n.* lord, master. Honorific affixed to the names of respectable women and, sometimes, men [as a pronoun

හාමිනේ, *n.* (resp. form of හාමි) (*f.*) Used also

හාමු, *n.* lord, master (Respectful term used separately or after a proper noun in respect of children of a Mudaliyar)

හාමුකර, *vt.* to mix

හාමුණ(ණු), *n.* six amunas

හාමුදුරු-වෝ, *n.* lord, master (generally used for Buddhist monks)

හාමුවෙ, *vi.* to be mixed up with

හාඝකා, *n.* a plant (*cortalaria laburnifolia*)

හාර්ජි-ය, *n.* brooch, breast-pin (*D.*)

හාර්ණල්කටු-ව, *n.* hair-pin (හාර්ණල් *D.*)

හාර්ට-ය, *n.* heart (in cards) (*D.*)

හාර, *a.*=සතර, four; *vt.* to dig (හෑරු)

හාර-ය, n. taking away, garland, necklace of pearls, etc., *n.* pus, matter (of a boil or sore)

හාරී, a. attracting, charming

හාල්(*b.*), *n.*=සාල්, unboiled rice

හාල්දණ්ඩා(-දඬු), *n.* ako. tree snake (*dendrophis picta*)

හාල්පස්, *n.* club rush (*fimbristylis globulosa*). *n.* -පැදීම(ම්), a disease of young paddy plants which fail to mature the ear and a shoot of grass appears in its stead

හාල්පොඟුදිය, *n.* water in which raw rice has been washed

හාල්බැබිය, *n.* a tree (*cipadissa fruticosa*)

හාල්මැස්සා(-මැසි), *n.* ako. small sea fish (*pl.* හාල්මැස්සෝ)

හාලු(ල්), *n.* unboiled rice

හාලාහල-ය, n.=හලාහලය

හාලි(*b.*), n. a class of Sinhalese people

හාවභාව-ය, } n. gesture of love, dalliance of
හාව-ය, } love

හා-වා, *n.* hare (*leapus nigricollis*) (*pl.* හාවෝ)

හාවෙ, *vi.* to become united [miracles

හාස්කම(ම), *n.* miracle. *vt.* හාස්කම්කර, to do

හාස-ය, n. laughter, ridicule, mirth. a. -ජනක, causing laughter, ridiculous. n. -රස-ය, sentiment of mirth or humour

හාසමග, *prep.* with, along with

හාස-ය, n. laughter, smile, mirth

හාහා, *ij.* hold! (expressing prevention)

හැක, n.=සැක. *vt.* -කර, to doubt

හැකරැල්ල(-රැළි), n. ako. millepede (*julus ater*)

හැකිරිල්ල, *n.* ako. night-shade (*solanum verbascifolium*)

හැකි, *a.* able, possible

හැකිරි(රි), *n.* gravelly place

හැකිල්ල(-කිලි), *n.* fetter, chain

හැකිලීම(ම), *n.* (*go.* හකුළ, හැකිළෙ) shrivelling

හැකිළෙ, *vi.* to shrivel (හැකුළුණු)

හැකුළුම(ම), n.=හැකිළීම [cealing

හැඟවී(or වු)ම(ම), n. (*go.* හඟව) intimating, con-

හැඟුම(ම), *n.* (*go.* හැඟෙ)

හැඟෙ, *vi.* to know, to feel; to perceive (හැඟුණු)

හැචිව-ය, n.=සැචිවය

හැවිලි-ය, *n.*=හවිල්ල

හැට, *n.* sixty

හැටි, *a.* like, similar. *n.* -ය, likeness, manner

හැඩවනු, *vt.* to incline, to slant, to be stylish

හැඩොල්ල(-ොලු), *n.* matted or clotted hair

හැඩාර, *n.*=හැඩෑහර

හැඩ-ය, *n.* form, shape

හැඩ-යා, *n.* ako club-moss (*lycopodium hookeri*)

හැඩවක, *n.* a tree (*chætocarpus castanocarpus*)

හැඬී, *vi.* (*bo.* හඬ) (*v.* ඇඬී)

හැඬීම(මි), *n.* (*go.* හඬ) weeping, crying [ඇඬිල්ල)

හැඩොංගු-ලා, *n.* ako. small fish (*pl.* හැඩො

හැත්, *n.* (*bo.* හැද)

හැත්ත(හැති), *n.*=සැත්ත

හැත්තෑ-ව, *n.*=හැත්තෑව

හැතෙමෙ, *vi.*=හැතෙමෙ

හැතැක්(or ප්)ම, *n.*=සැතැප්ම

හැති(*b.*), *n.* cluster of flowers; panting (*v.* හති)

හැතිරි, *n.*=සැතිරි

හැද, *a.*=දැද. *pp.* having drawn. *n.*=සැද

හැදෑරීම(මි), *n.* (*go.* හදාර) saying, reciting

හැදිලි(*b.*), *n.* crooked man, hunchback

හැදීම(මි), *n.* (*go.* හැදෙ, හද) growing, making

හැදෙනු, *vi.* to grow, to thrive (හැදුණු)

හැද, *n.*=ඇඳ, bed. *pp.* (from හඳ) having dressed, having drawn (a picture)

හැඳියා, *vt.* to stir with a spoon (හැඳිනැ)
හැඳිඅල්ලු-ව, *n.* rest for cocoanut shell ladles
හැන්ද(හැඳි), *n.* spoon
හැන්දෑ-ව, *n.* evening
හැන්නැද්ද(-නැදි), *n.* head fisherman
හැප්පෙ, *vi.* to strike against (හැප්පුනු)
හැපින්නි, *n.*=හැපින්නි
හැපෙ, *vi.*=හැප්පෙ
හැබෑ-ව, *n.*=හැබෑව
හැඹිලි(*b.*), *n.* shell fish [හිලිය]
හැඹිලි-ය, *n.* purse made of rush, etc. (*v.* හැ
හැම, *a.* all, every. *n.* -දා, every day
හැමදී(or දු)මේ(මෙ), *n.* (*go.* හමදී) sweeping
හැමතිල්ල, *n.* a plant (*dysophylla auricularia*
හැමි-ඤා, *n.*=හැමිඤා
හැමීම(මු), *n.* (*go.* හම) blowing (as wind)
හැමෝම, *pr.* all (without exception)
හැයි, *ad.* or *ij.*=ඇයි
හැර, *pp.* & *prep.*=ඇර (*v.* හැරය)
හැරගහ, *vt.* to make bands round a tree to serve as steps to ascend it
හැරපට, *n.* band round a tree serving as a step
හැරමිටි-ය, *n.* walking stick [හැරපට]
හැර-ය, *n.* band, basket of eatables (*v.* හැරගහ,
හැරලු, *vt.* to conduct and leave (*v.* ඇරලු)
හැරව, *n.* pus (*v.* සැරව)

හැරවීම(or වු)ම(ම), n. (go. හරව) causing to turn or leave, turning [ing, leaving

හැරීම(ම), n. (go. හැරෙ, හරි), turning, send-

හැරෙන, vi. to turn, to be left (හැරුණු)

හැල්, a. cold. n. hill paddy (v. ඇල්) [alhagi)

හැල්කට(or ක)මිලියා, n. a plant (hedysarum

හැල්බත(ත්), n. paddy field overflowed with water, swamp

හැල්ම, n. trot. හැල්මෙහි, to trot

හැරල(හැලි), n. waterfall, rapid (v. ඇල්ල)

හැල(ල්), n. swamp, marshy land [ring

හැලවී(or වු)ම(ම), n. (go. හලව) shaking, stir-

හැලි, a. white (v. ඇලි)

හැලීම(ම), n. (go. හල, හැලෙ)=හැලීම

හැලෙ, vi. to shake, to drop (හැලුණු)

හැව-ය, n.=හැවය

හැවරිය, n. a plant (cyperus dehiscens)

හැවිතාර-ය, n. anxiety, solicitude

හැවිරිද්ද(-රිදි), n. year (v. ඇවිරිද්ද)

හැවි or වු)ල්ල(-විලි), } n. (go. හව) cursing,
හැවි(or වු)ම(ම), } malediction

හැමෝම, pr. all, every one (v. හැමෝම) [smooth

හැසූ, ppa. (from හස) chipped to make

හැසිරීම(ම), n. (go. හැසිරෙ) moving, conduct

හැසිරෙ, vi. to move, to behave (හැසුරුණු)

හැඩුරු, *a.* crowded, thick, congealed

හැළඹ, *n.* a tree (*stephegyne parviflora*)

හැළලිහිණි-යා, *n.*=හැළලිහිණියා

හැළි-ය, *n.* cooking pot, water fall

හැංගෙන, *vi.* to hide one's-self, to lie concealed

හෑම(ය), *n.* (*go.* හා) ploughing

හෑ-යා, *n.*=ඇයා

හෑරීම(ය), *n.* (*go.* හාරා, හෑරෙ) digging

හෑරෙ, *vi.* to be dug, to be deepened (හෑරුණු)

හෑල්ල(හෑලි), *n.* ako, poetry, rigmarole [etc.)

හි, *ij.* oh! fie! (expressing surprise, contempt,

හි, *vi.*=හ, to laugh

හික්, *n.* a tree (*odina woodier*), teaching, the science which teaches the proper pronunciation of words and laws of euphony

හික්කා-ව, n. hiccough

හික්මව, *vt.* to tame, to train, to teach (හික්මවූ)

හික්මී-යා, *n.* musk rat (*sorex cœrulescens*)

හික්මීම or හික්මුම(ය), *n.* (*go.* හික්මෙ) becoming docile or obedient

හික්මුණුකම(ය), *n.* docility, obedience

හික්මෙ, *vi.* to become docile or obedient

හිකනලා(ය), *n.* skink, Brahmin lizard [needy

හිඟ, *n.* deficiency, remainder, scarcity. *a.* scarce,

හිඟ, *vt.* to beg (හිඟූ)

භික්ෂකයා(-කයා), *n.* beggar (*pl.* භික්ෂකයෝ)

භික්ෂාව(ය), *n.* begging, beggary, alms

භිසිනි, *n* =ඉසිනි

භෘශ(or ශ), *ad.* quickly, immediately

හිතුරල, *n.* ako. yam [*concinna*)

හිඟුරු, *n.* ginger, a prickly plant (*acacia*

හිඟුරුපිටිය, *n.* a plant (හිඟුරු)

හිඟුරුපිනලි, *n.*=සිඟුරුපිනලි [*tuka*)

හිඟුල(*b.*), *n.* vermillion, a plant (*amoora rohi-*

හිංගු(*b.*), n. assafœtida

හිංගුල(or ලි)(*b.*), n. vermillion [from

හිට, *pp.*—සිට, having been, beginning from,

හිටපු, —සිටි

හිටවනු, *vt.* to cause to stand, to plant (හිටෙවුවු)

හිටාගන්නා(නා), *n.*=සිටාගතා

හිඳ, *n.*=ඉඳ. *vi.*=සිඳ (හිඳය)

හිඳුව, *vt.* සිඳුව [illegible] [ම ..=ඉණිමග

හිණ(ණි), *n.* ladder, stairs, waist, lap *n.*' හිණි

හිණි, *a.* small, minute

හිතූ(*b.*), *n* =හිත

හිතුදුමිල, *n.*—[illegible] [ive

හිත, *n.* (*bo.* [illegible]) *a.* [illegible], attract-

හිතවනු, *vt.*=හිතනු

හිතවතා, *n.* friend

හිත්දූඩි, *a.* hard-hearted, stubborn

හිත(ත්), *n.* mind. *a.* fit, good, beneficial. *vt.*

හිතකාමී, a. wishing well [හිත—හිත

හිතුබුඩි-ය, *n.* self-will, fancy, caprice

හිතුමත-ය, *n.*—හිතුබුඩිය

හිතුල්, *n.*—කිතුල් [acts as he chooses

හිතුවක්කාර, *a.* self-willed. *n.* -යා, man who

හිතෙසී, *a.* (Pali form of හිතෛෂී)

හිතෛෂී, a. desiring another's welfare

හිතෝපදේශ-ය, n. friendly advice, salutary instruction, name of a Sanskrit book

හිද, *n.* hole, needle, rivulet, heart. *ij.* a term used to direct elephants

හිදස(ස්), *n.* hole, peep-hole

හිදිකටු-ව, *n.*—ඉදිකටුව

හිදුමල, *n.* penetration, piercing

හිමෙදුනු-ව, *n.*—ඊමෙදුනුව [to sit down

හිඳ, *pp.* (from හිඳි) having sat, etc. *vi.* -නවා,

හිඳි, *vi.* & *vt.* to sit, to cut off, to pluck off, to prepare or express (oil) (හින්ද)

හිඳිලුණු, *n.* salt prepared by evaporation [(*imp.*)

හිඳු(*b.*), *n.* quill of the porcupine. *vi.* sit, be

හිඳු(or ඳි)ම(ු), *n.* (*go.* හිඳි) sitting, etc.

හිඳුව, *vt.* to cause to sit, to plant, to boil down (හින්දෙවූ)

හිඳෙ, *vi.* to dry up (by evaporation) (හිඳුණු)

හිඟොල, n.—කිතුල්

හිඳ, *vt.* to boil down (හින්දූ)

හින්ද, *prep.*—නන්ද, *pp.* (from හින්ද)

හින්දෙ, *vi.*—හිඳෙ

හින්න(හිණි), *n.* minute part, stick, ladder [ගෙනෝ)

හින්නා(හිණි), *n.* very minute ant; wart (*pl.* හින්

හින්නා(or නෑ)-වා, *n.* washer for the Salagama people (*pl.* හින්නාවෝ)

හිනවලු, *n.* a tree (*v.* හිලු)

හිනහ-ව, හිනා-ව, } *n.*=සිනාව. *vi.* -සෙව—සිනාසෙව

හිනි, *vi.* (he, she, or it) fell (*v.* ෙහ)

හිඹිලි(*b.*), *n.* basket used for fishing

හිඹ, *vt.*=සිඹ (root of හිඹි)

හිඹි, *vt.*—ඉඹි (හිඹව)

හිඹුටු, *n.* a plant (*salacia reticulata*)

හිඹුල්, *n.*=ඉඹුල්

හිම(ම), *n.*—ඉම

හිම(*b.*), n. forest, jungle, white sandal wood, dew, frost, snow, cold season, moon, Himalaya mountain

හිමකල(ල්), *n.* cold or snowy season (comprising the months of උඳුවප් & දුරුතු)

හිමාල(ල්), හිමගිර(රි), } *n.* the Himalaya mountain

හිමත්(or ස්), *n.*=හිමකල

හිමෙව(*b.*), *n.* the Himalaya mountain

හිම-ය, n.=හිම

හිමරශ්මි, n. } (b.) moon, mass of ice or snow
හිමරැස්, n. }

හිමවු, n. }
හිමවුකුළු, n. } (b.) the Himalaya mountain
හිමවත්, n. }

හිමශෛල-ය, n. the Himalaya mountain

හිමසව, n. } (b.)=හිමකාල
හිමසමය, n. }

හිමසෙලල(ල), n.=හිමශෛලය

හිමාලය(b.), n. the Himalaya mountain

හිමි, n. (bo. හිමියා). a. belonging to, owning. n. -කම(ම), ownership

හිමිකර, vt. to make the owner of

හිමිදිරි-ය, n. twilight

හිමි-යා, n. lord, owner, husband (pl. හිමියෝ)

හිමිවෙ, vi. to become owner, to inherit

හිය-ය, n. arrow. හියඹුර(රු), archer's quiver

හිත, a. beneficial (v. හිත)

හිඳුවු(b.), letter හි, causing to sit, planting

හිපර, vt. to fold, to wrap round (හිපෑරී)

හිඹාරෙර, vi. to diffuse, to pervade (හිඹාරුණු)

හිහාර(රු), n.=හියඹුර

හිර(රි), n. sun, line, stroke, lime stone [(bo. හිරය)

හිර, a. confined, imprisoned. n. (b.) prisoner

හිරකර, vt. to block up, to imprison

හිරකාර-යා, *n.* prisoner (*pl.* හිරකාරයෝ)
හිරබැස්සනවා, සෙව, *vi.* to set (of the sun)
හිරගෙනෙනවා, *vt.* to bring a wife, to wed
හිරගෙය-ගේ, *n.* prison, jail
හිරණ්‍ය(*b.*), n. gold, wealth
හිරමඬ(or ඬු)ල(ල්), *n.* sun's disc
හිරමණ-ය, *n.* cocoanut scraper
හිරමණ්ඩූස්සා, *n.* a plant (*zapania nodiflora*)
හිර-ය, *n.* imprisonment, obstruction, marriage(*T.*)
හිරවරණ, *n.* parasole, umbrella
හිරවෙව, *vi.* to be confined, to be blocked up
හිරි, *a.* benumbed.‖*n.* (*b.*) shame, sun, line, lion, strip of gingle, row, numbness (*v.* හිර)
හිරිකෙස්බු-ව, *n.* weariness, lassitude
හිරිකඩ, *n.* spray. *vi.* -වැටෙ, to fall in spray
හිරිකිසි(or සි)ය, *n.* disgust or unpleasant feeling caused by filth
හිරිගඩ-ය, *n.* numbness
හිරිගල(ල්), *n.* coral or lime stone
හිරිතල, *n.* ako. yam (*dioscorea oppositifolia*)
හිරිමල(ල්), *n.* very tender fruit
හිරියල්, *n*, yellow orpiment [(of teeth)
හිරිවැටෙව, *vi.* to become numb, to be on edge
හිරිවෙරිය, *n.* = ක්‍රිමිවෙරිය [to oppress
හිරිහැර-ය, *n.* trouble. *vt.* -කර, to trouble,

හිරු(b.), n. sun, line, a plant (මරු)
හිරුගොත්(b.), n. solar race or dynasty
හිරුණු, ppa. (from හිරෙ) torn, split
හිරුතොනස්(b.), n. planet Saturn
හිරුදූ, n. the river Yamuna
හිරු(පි or පු)ත්(b.), n. epithet of Yama
හිරුමෙසෙ(b.), n. peacock
හිරෙ, vi.=ඉරෙ
හිල්, n. (bo. හිල). vt. -කර, to make a hole
හිල්වෙ, vi. to get perforated, to have a hole in
